**බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය**

**බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

2015.08.21 දිනැති අංක 1928/28 හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද සහ 2016 .03.01 දිනැති අංක 1956/16 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් හා 2019.09.16 දිනැති අංක 2141/6 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 5 පරිශිෂ්ඨය පරිදි සහ අංක 2064/8 හා 2018.03.26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත බලතල පැවරීම අනුව, පුරප්පාඩුව ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය 1 ශ්‍රේණියේ බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ වසර පහක (05) පළපුරුද්දක් සහිත අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

3.1. ජ්‍යෙෂ්ඨතාවය උපරිම ලකුණු 50

ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස් වූ දින සිට වසරකට ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 අනුව I ශ්‍රේණියේ වැඩිම සේවා කාලය සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස I ශ්‍රේණියේ සේවා කාලය සඳහා ද ලකුණු හිමි වන පරිදි ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ (අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවම සේවා කාලයට අමතරව වන සේවා කාලය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ).

සටහන : ශ්‍රී. ලං.අ.ප.සේ. II ශ්‍රේණියේ වසර දෙක (02)ක සේවා කාලයක් සහිතව II හා III වල ශ්‍රේණිවල වසර 12කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරාලීමෙන් පසුව I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති නිලධාරීන්ගේ, එම මුළු සේවා කාලය වසර 12ට සහ II ශ්‍රේණියේ වසර දෙකට වඩා වූ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ද I ශ්‍රේණියේ සේවා කාලයක් සේ සලකා ලකුණු ලබා දෙනු ලැබේ.

3.2. අධ්‍යාපන සුදුසුකම් උපරිම ලකුණු 15

2.1 දර්ශනශූරි (PhD) – ලකුණු 15

2.2 දර්ශනපති (M Phil) – ලකුණු 12

2.3 පශ්චාත් උපාධිය – ලකුණු 10

2.4 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව – ලකුණු 07

(කාර්යක්ෂමතා කඩඉම්වලින් නිදහස් කිරීමට සලකා බලන ලද සුදුසුකම් හැර වෙනත් අධ්‍යාපන සුදුසුකම් පමණක් ඉහත ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන අතර එක් සහතිකයකට/ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල/ආයතන වෙතින් හදාරා ඇති සේවා ව්‍යවස්ථාවේ සඳහන් වන හෝ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් අදාළ ලකුණු ලබා දෙනු ලැබේ.)

3.3. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන උපරිම ලකුණු 10

3.3.1 පර්යේෂණ

තනි පුද්ගල පර්යේෂණ වාර්තා – ලකුණු 05 x 2

කණ්ඩායම් පර්යේෂණ වාර්තා – ලකුණු 03 x 2

(පශ්චාත් උපාධියට/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ/ නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට (Research Symposium) ඉදිරිපත් කරන ලද හෝ පර්යේෂණ සඟරාවක (Research Journal) පළ කරන ලද පර්යේෂණ වාර්තා සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ).

3.3.2 පොත් හා සඟරා – ලකුණු 05 x 2

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මගින් අනුමැතිය ලද තනි පුද්ගල කතෘ හිමිකාරීත්වයක් දරණ පොත් හා සඟරා සඳහා පමණක් ලකුණු ලබා දීමේ දී සළකා බලනු ලැබේ).

* උපරිම පර්යේෂණ හා/හෝ ග්‍රන්ථ දෙකක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

3.3.3 අධ්‍යාපන ප්‍රකාශන සඳහා ලබා දෙන ලද වාර්තා හා ශාස්ත්‍රීය සංග්‍රහ එකකට ලකුණු 02 බැගින් උපරිම 05ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

3.4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය උපරිම ලකුණු 05

(සන්නිවේදන කුසලතාවය පිළිබඳව සළකා බලනු ලැබේ.)

3.5. ඉදිරිපත් කිරීම උපරිම ලකුණු 10

සේවා ස්ථානයේ, (පාසල/ අධ්‍යාපන අමාත්‍යාංශය/ අධ්‍යාපන දෙපාර්තමේන්තුව/ කලාප කාර්යාලය/කොට්ඨාස කාර්යාලය) රාජකාරි ඉටු කිරීමේ දී, අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මූලික වූ කරුණක්/ අවස්ථාවක් පදනම් කරගෙන එය විශ්ලේෂණය කරමින් කරනු ලබන ඉදිරිපත් කිරීමක් සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

ප්‍රවේශය හා හැඳින්වීම – ලකුණු 2

අන්තර්ගතය – ලකුණු 2

iii. කාල කළමනාකරණය – ලකුණු 2

ඉදිරිපත් කිරීමේ විලාශය – ලකුණු 2

නිමාව හා නිගමනය – ලකුණු 2

ඒ සඳහා පරිගණක ආශ්‍රයෙන් (Power Point) හෝ වෙනත් සුදුසු මාධ්‍යයකින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර සිදු කරනු ලබන ඉදිරිපත් කිරීමට අදාළ දෘඪ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දිය යුතු වේ. (පරිගණක සාක්ෂරතාවයද මෙහිදී සලකා බලනු ලැබේ.)

3.6. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලැබූ සමස්ථ කුසලතාවය උපරිම ලකුණු 10

බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා වන අයදුම්පත්‍රය මෙතනින් බාගත හැකිය.

අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2023.06.12 වේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර, "බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,බත්තරමුල්ල." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු වේ.

අසම්පූර්ණ, අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පී. සෝමසිරි

ආණ්ඩුකාර ලේකම්

බස්නාහිර පළාත.

2023.05.11